**වෙරුගල් ප්‍රාදේශීය සභාව**

**-----------------------------**

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

**----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශ**

**--------------**

**1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම**

**-------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2015 ජූලි 28 දින ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මැයි 28 දින ඉදිරිපත් කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 නොවැම්බර් 12 දින සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරන ලදි.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට වෙරුගල් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්**

**---------------------------------------**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම.**

**-------------------------------------------------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය මූල්‍ය ප්‍රකාශයන් සමඟ ඉදිරිපත් කළයුතු වුවත් එම ප්‍රකාශයන් ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**--------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශයන්හි හෙළිදරව් කර නොතිබුණි.

**1.3.3 ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

(අ) ඡායා පිටපත් යන්ත්‍රය සහ පරිගණකය අළුත්වැඩියා කිරීමට සහ සායම් මිලදී ගැනීමට වැය කළ එකතුව රු.142,275 ක් වූ වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා තිබුණි.

(ආ) කොම්පෝස්ට් පොහොර බඳුන් මිලදී ගැනීම වෙනුවෙන් පුද්ගලික සමාගමකට ගෙවිය යුතු මුදල රු.198,475 ක් වුවද, මූල්‍ය ප්‍රකාශයන්හි ගෙවිය යුතු මුදල රු.498,475 ක් ලෙස දක්වා තිබීම නිසා ගෙවිය යුතු මුදල් ප්‍රමාණය රු.300,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු.47,954 ක් වූ විවිධ ණයහිමි ශේෂ 04 ක් වර්ෂ 7 ක කාලයක් තිස්සේ නිරවුල් නොකොට හිඟව පැවතුණි.

(ආ) 2012 සහ 2013 වර්ෂයන්හි මාර්ග තලන යන්ත්‍රය කුලියට දීම වෙනුවෙන් අයවිය යුතු රු.121,000 ක මුදල අයකර ගැනීම සඳහා 2015 සැප්තැම්බර් 09 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2009 වර්ෂයේ සිට ණයගැතියන්ගෙන් අයකරගත යුතුව තිබූ රු 2,818,827 ක් අයකර ගැනීම සඳහා කටයුතු නොකොට අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා තිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇති පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් සහ ගොඩනැගිලි | **33,684,089** | ස්ථාවර වත්කම් ලේඛනය |
| මෝටර් වාහන සහ කරත්ත | **7,425,137** | |
| පොදු ගබඩා තොග | **22,500** | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ආදායම් ණයගැතියෝ | **2,949,852** | සනාථ කිරීමේ ලිපි |
| ණය හිමියෝ | **1,852,014** | ණය හිමි ලේඛනය |

**1.3.6 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) පළාත් මූල්‍ය රීති (ප.මූ.රී) | | |
| (i) ප.මූ.රී 237 | - | සභාව විසින් වර්ෂ 04 කට පෙර නිකුත් කරන ලද එකතු වටිනාකම රු.28,171 ක් වූ චෙක්පත් 10 ක් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොතිබුණු නමුත් මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) ප.මූ.රී 432.1 | - | 2014 වර්ෂයේදී වාහන 07 ක් අළුත්වැඩියා කිරීම සඳහා රු.272,820 ක් වැයකර තිබුණු නමුත් එය වාහන ලොග් පොත්වල සටහන් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම් ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.792,361 ක් වූ අතර එයට එරෙහිව ඉකුත් වර්ෂය සඳහා ආදායම් අතිරික්තය රු.2,518,976 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,311,337 ක පිරිහීමක් දක්නට ලැබුණි.

### 2.2 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිතහිග ආදායම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් සහ බදු | 332,050 | 295,775 | 36,275 |
| කුලී | 730,800 | 431,420 | 299,380 |
| බලපත්‍ර ගාස්තු | 10,803,000 | 52,690 | 1,027,610 |
| වෙනත් ආදායම් | 460,700 | 1,097,108 | - |
| | 12,326,550 | 1,876,993 | 1,360,265 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභා සේවකයන්ට සහ වෙනත් ආයතනයන්ට ගෙවිය යුතු රු.594,724 ක මුදලක්, නිරවුල් නොකොට 2008 සිට 2013 දක්වා කාලයක් ගෙවිය යුතු අත්තිකාරම් ගිණුමෙහි දක්වා තිබුණි.

(ආ) 2013 ජුනි මාසයේ සිට 2014 දෙසැම්බර් දක්වා කියවන්නන්ට ලබාදුන් පුස්තකාල පොත් 87 ක් ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. සාමාජිකයන් 42 ක ගෙන් ලබාගත් සාමාජික අයදුම්පත් නිසි ලෙස සම්පූර්ණ කර නොතිබීම නිසා පොත් ආපසු දීමට අපොහොසත් වූ කියවන්නන් පිළිබඳ නිවැරදි විස්තර ලබාගත නොහැකි විය.

### 3.2 ආදායම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂය සඳහා අයතරගත යුතු මුද්දර ගාස්තු රු.26,250 ක් විගණිත දිනය වන 2015 සැප්තැම්බර් 09 දින වනවිටත් අයකරගෙන නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

(අ) ළමා උද්‍යානය ඉදිකිරීම.

2013 වර්ෂයේදී පවත්වන ලද දැයට කිරුළ වැඩසටහන යටතේ ළමා උද්‍යානයක් ඉදිකිරීම සඳහා 2013 ජනවාරි 16 දින වෙරුගල් ප්‍රාදේශීය සභාව විසින් රු.7,072,527 කට ගිවිසුමක් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 මාර්තු 01 දිනට ප්‍රථම ඉදිකිරීම් කටයුතු අවසන් කළයුතු වුවද විගණිත දින වන 2015 සැප්තැම්බර් 09 දින වනවිටත් ඉදිකිරීම් කටයුතු නිම කොට නොතිබුණි.

(ii) කොන්ත්‍රාත්කරු විසින් ප්‍රධාන දොරටුව සවිකර නොතිබුණු අතර උද්‍යානයට අවශ්‍ය උපකරණද සපයා නොතිබුණු නමුත් එම වැඩ විෂයයන් සතුටුදායක ලෙස නිමකළ බවට සහතික කොට කොන්ත්‍රාත්කරුට රු.1,951,338 ක මුදලක් ගෙවා තිබුණි.

3.4 උපයෝජනය නොකළ සභාවේ වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවට අයත් රු.500,000 ක් වටිනා රෝද හතරේ ට්‍රැක්ටර් 02 ක් සහ රෝද දෙකේ ට්‍රැක්ටරයක් වර්ෂ 05 ක් තිස්සේ අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) සභාවට අයත් රු.2,272,800 ක් වටිනා කඩකාමර 07 කින් යුතු සාප්පු සංකීර්ණය කුලියට දීමට පියවර නොගෙන 2011 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2015 සැප්තැම්බර් 09 දින දක්වා නිෂ්ක්‍රීයව තිබුණි.

3.5 මානව සම්පත් කළමනාකරණය

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සහ තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| කාර්ය මණ්ඩල වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විධායක | 01 | - | 01 | - |
| සහායක | 15 | 12 | 03 | - |
| සුළු සේවක | 30 | 13 | 17 | - |
| වෙනත් | - | 33 | - | 33 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අධි ශ්‍රේණිය I තනතුරෙහි පුරප්පාඩුවක් සහ කළමනාකරණ සහායක තනතුරුවල පුරප්පාඩු 03 ක් ඉකුත් වර්ෂ 05 තිස්සේ පැවතියද එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

4. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ස්ථාවර වත්කම් පාලනය
(ඇ) අත්තිකාරම් අයකර ගැනීම
(ඈ) ආදායම් එකතු කිරීම
(ඉ) ප්‍රසම්පාදන පරිපාටිය
(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය